වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## තනතුරු පුරප්පාඩු

**ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ නියාමන, සංවර්ධන සහ අලෙවි ප්‍රවර්ධන කටයුතු ඉටුකිරීම සඳහා ක්‍රියාත්මක වන ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව තුළ පවතින පහත දැක්වෙන තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් කාර්යශීලි, උද්යෝගිමත් හා විචක්ෂණශීලි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

### 01. තේ උපදේශක / පරීක්ෂක III ශ්‍රේණිය (MA 2-1) - තනතුරු පුරප්පාඩු 06

**රැකියා පිරිවිතරය :-**

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ බලය ලත් නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ සංවර්ධන හා නියාමන ක්‍රියාකාරකම් ඉටුකිරීම සඳහා ලියාපදිංචි තේ නිෂ්පාදකයින්, ලියාපදිංචි අමු තේ දළු වෙළඳුන්, තේ ඇසුරුම්කරුවන් හා තේ ගබඩා අධීක්ෂණය/පරීක්ෂාව හා තේ අපනයනකරුවන් පරීක්ෂාව හා අධීක්ෂණය.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :-**

**බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :-**

(අ) අ.පො.ස (උ/පෙ) විභාගයෙන් විද්‍යා විෂය ධාරාවෙන් එක් වරකදී විෂයයන් තුනකින් සමත්වීම සහ අ.පො.ස (සා/පෙ) විභාගයෙන් ගණිතය, ඉංග්‍රීසි සහ සිංහල/දෙමළ විෂයයන්ද ඇතුළුව සම්මාන 05 ක් සහිතව එකවර සමත් වී තිබීම සහ ශ්‍රී ලංකා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් කෘෂිකර්මය පිළිබඳ NVQ 05 මට්ටමට නොඅඩු සුදුසුකමක් ලබා තිබීම.

### 02. කාර්මික සහකාර (නඩත්තු) III ශ්‍රේණිය MA (2-1) - තනතුරු පුරප්පාඩු 01

**රැකියා පිරිවිතරය :-**

ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙහි බලය ලත් නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ තේ මණ්ඩලයෙහි ගොඩනැගිලි, වාහන, යන්ත්‍රෝපකරණවල නඩත්තු කටයුතු ඉටුකිරීම.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :-**

**බාහිර අයදුම්කරුවන් (අ හෝ ආ) :-**

(අ) පිළිගත් ආයතනයකින් අදාල ක්ෂේත්‍රයෙහි ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ 5) මට්ටමට නොඅඩු සුදුසුකමක් ලබා තිබීම සහ ගණිතය, සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි විෂයන් ඇතුළුව සම්මාන 04 සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස (සා/පෙ) විභාගය සමත් වී තිබීම.

(ආ) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ සිවිල් ඉංජිනේරු / යාන්ත්‍රික ඉංජිනේරු / විදුලි ඉංජිනේරු උපාධියෙහි III මට්ටම සමත්ව තිබීම සහ ගණිතය, සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි විෂයන් ඇතුළුව සම්මාන 04 සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස (සා/පෙ) විභාගය සමත් වී තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :-**

(අ) ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙහි ප්‍රාථමික (පුහුණු/අර්ධ පුහුණු/නුපුහුණු) මට්ටමේ තනතුරක අයදුම්පත් කැඳවන අවසන් දිනට අවම වශයෙන් වසර 05ක ස්ථිර සේවා කාලයක් සපුරා ඇති, පිළිගත් ආයතනයකින් අදාල ක්ෂේත්‍රයෙහි ජාතික වෘත්තීය සුදුසුකම් 5 මට්ටමට (NVQ 5) නොඅඩු සුදුසුකම් ලබා තිබීම සහ ගණිතය හා සිංහල/දෙමළ භාෂාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්මාන සාමාර්ථ 4 ක් සහිතව අ.පො.ස. (සා/පෙ) විභාගය සමත් වී ඇති අයදුම්කරුවන්.

### 03. සහකාර තේ රස බලන්නා III ශ්‍රේණිය (MA 2-1) - තනතුරු පුරප්පාඩු 01

**රැකියා පිරිවිතරය :-**

බලය ලත් නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ තේ රස බැලීම් සහ තේ රස බැලීම් කටයුතු සඳහා අවශ්‍ය සහාය ලබාදීම සහ වාර්තා සැකසීම.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :-**

**බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :-**

(අ) කෘෂිකර්මය / ආහාර විද්‍යාව / විද්‍යා විෂය ධාරාවන් යටතේ ශ්‍රී ලංකා තෘතීය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක අවම වශයෙන් ජාතික වෘත්තීය සුදුසුකමෙහි 05 වැනි මට්ටමෙහි සහතිකයක් (NVQ 5) ලබා තිබීම.

**තේ උපදේශක / පරීක්ෂක, තාක්ෂණ සහකාර (නඩත්තු) සහ සහකාර තේ රස බලන්නා තනතුරුවලට තෝරා ගැනීම :-**

ලිඛිත විභාගයකින් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**ලිඛිත පරීක්ෂණය සඳහා විෂයන් සහ ලකුණු ලබාදීමේ ක්‍රමවේදය :-**

| විෂය | කාලය හා ලකුණු | | විභාග මධ්‍යය |
|---|---|---|---|
| ■ භාෂා හැකියාව | (ලකුණු 100) | (පැය - 1½) | ඉංග්‍රීසි හා සිංහල භාෂාව |
| ■ යෝග්‍යතා පරීක්ෂණය | (ලකුණු 100) | (විනාඩි - 45 ) | සිංහල හෝ දමිල භාෂාව |
| ■ තනතුරට අදාල විෂය දැනුම | (ලකුණු 100) | (පැය - 03) | සිංහල හෝ දමිල භාෂාව |

විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යය අයදුම්පත්‍රයේ සටහන් කල යුතුය.

ලිඛිත විභාගය සමත්වීම සඳහා එක් විෂයකට අවම වශයෙන් 40% ක් ලකුණු ලබා තිබීම සහ සමස්ථ විභාගයෙන් 50% ක සාමාන්‍යයක් ලබා තිබීම අවශ්‍යය.

**වැටුප් පරිමාණය :-**

MA 2-1: රු. 50,540 - 10 × රු. 540 - 7 × රු. 630 - 4 × රු. 890 - 20 × රු. 1,190 - රු. 87,710 (මාසිකව)

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 උපලේඛන II අනුව ආරම්භක මාසික වැටුප් පියවර රු. 43,379/- හා රජයේ අනුමත අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ. ඒ අනුව ආසන්න වශයෙන් රු. 61,179/- පමණ ආරම්භක මාසික දළ වැටුපක් හිමිවේ.

**වයස් සීමාව :-**

අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම වයස් සීමාව බල නොපවත්වනු ඇත.

### 04. කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන) III ශ්‍රේණිය (MA 1-1) - තනතුරු පුරප්පාඩු 18

**රැකියා පිරිවිතරය :-**

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ බලය ලත් නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ කාර්යාලීය රාජකාරි කටයුතු ඉටුකිරීම.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :-**

**බාහිර අයදුම්කරුවන් :-**

අ.පො.ස. (උ/පෙ) විභාගයෙන් එකවර විෂයයන් තුනකින් සමත්වීම සහ අ.පො.ස (සා/පෙ) විභාගයෙන් ගණිතය, ඉංග්‍රීසි සහ සිංහල/දෙමළ විෂයයන්ද ඇතුළුව සම්මාන 04 ක් සහිතව විෂයන් 6 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් වී තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :-**

(අ) ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙහි ප්‍රාථමික (පුහුණු/අර්ධ පුහුණු/නුපුහුණු) මට්ටමේ තනතුරක අවම වශයෙන් අයදුම්පත් කැඳවන අවසන් දිනට වසර 05ක ස්ථිර සේවා කාලයක් සපුරා ඇති ගණිතය හා සිංහල/දෙමළ විෂයන්ද ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්මාන සාමාර්ථ 4 ක් සහිතව අ.පො.ස. (සා/පෙ) විභාගය සමත් වී තිබීම.

**සටහන :-** අභ්‍යන්තර අයදුම්කරුවන්ට පවත්වන සීමිත පරීක්ෂණයයේ ප්‍රතිඵල මත පුරප්පාඩුවලින් 30% ක් සඳහා බඳවාගැනීම් සිදු කරනු ලැබේ.

### 05. පුද්ගලික සහකාර III ශ්‍රේණිය (MA 1-1) - තනතුරු පුරප්පාඩු 04

**රැකියා පිරිවිතරය :-**

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ බලය ලත් නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ කාර්යාලීය රාජකාරි කටයුතු ඉටුකිරීම.

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :-**

**බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :-**

අ.පො.ස. (උ/පෙ) විභාගයෙන් එකවර විෂයයන් තුනකින් සමත්වීම සහ අ.පො.ස (සා/පෙ) විභාගයෙන් ගණිතය, ඉංග්‍රීසි සහ සිංහල/දෙමළ විෂයයන්ද ඇතුළුව සම්මාන 04 ක් සහිතව විෂයන් 6 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් වී තිබීම.

ඉංග්‍රීසි භාෂා ලඝු ලේඛණය පිළිබඳ හැකියාව අමතර සුදුසුකමක් වනු ඇත.

**කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන) සහ පුද්ගලික සහකාර තනතුරුවලට තෝරා ගැනීම :-**

ලිඛිත විභාගයකින් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

ලිඛිත පරීක්ෂණය සඳහා විෂයන්, ලකුණු ලබාදීමේ ක්‍රමවේදය හා විභාග මාධ්‍ය

| විෂය | කාලය හා ලකුණු | | විභාග මාධ්‍යය |
|---|---|---|---|
| ✦ භාෂා හැකියාව | (ලකුණු 100) | (පැය - 1½) | ඉංග්‍රීසි හා සිංහල භාෂා දැනුම |
| ✦ යෝග්‍යතා පරීක්ෂණය | (ලකුණු 100) | (විනාඩි - 45) | සිංහල/දමිල මාධ්‍යය |
| ✦ සාමාන්‍ය දැනුම | (ලකුණු 100) | (පැය - 03) | සිංහල/දමිල මාධ්‍යය |
| ✦ පරිගනක හැකියාව | (ලකුණු 100) | (පැය - 01) | ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණි |

විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යය අයදුම්පත්‍රයේ සටහන් කල යුතුය.

ලිඛිත විභාගය සමත්වීම සඳහා එක් විෂයකට අවම වශයෙන් 40% ක් ලකුණු ලබා තිබීම සහ සමස්ථ විභාගයෙන් 50% ක සාමාන්‍යයක් ලබා තිබීම අවශ්‍යය.

**වැටුප් පරිමාණය :-**

MA 1-1: රු. 46,220 - 10 × රු. 540 - 7 × රු. 630 - 4 × රු. 890 - 20 × රු. 1,190 - රු. 83,390 (මාසිකව)

කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 උපලේඛන II අනුව ආරම්භක මාසික වැටුප් පියවර රු. 40,403/- හා රජයේ අනුමත අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ. ඒ අනුව ආසන්න වශයෙන් රු. 58,203/- පමණ ආරම්භක මාසික දළ වැටුපක් හිමිවේ.

**වයස් සීමාව :-**

අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම වයස් සීමාව බල නොපවත්වනු ඇත.

**වෙනත්/පොදු ප්‍රතිලාභ :-**

- ✤ මණ්ඩලයේ දැනට පවතින නීතිරීතිවලට අනුකූලව වෛද්‍ය සහනාධාර පහසුකම් ලබාදෙනු ඇත.
- ✤ තෝරාගනු ලබන අයදුම්කරුවන් ඔහුගේ/ඇයගේ වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය සඳහා ගෙවිය යුතු අතර මණ්ඩලය ඒ සඳහා 15% කින් දායක වනු ඇත.
- ✤ මණ්ඩලය තවදුරටත් සේවා නියුක්ත භාර අරමුදලට ඔහුගේ/ඇයගේ වැටුපෙන් 3% කින් දායක වනු ඇත.

**පොදු කොන්දේසි :-**

- ✤ සියලු අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
- ✤ සියලු අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍යවන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත මනා සෞඛ්‍ය තත්ත්වයකින් පරිපූර්ණ විය යුතුය.
- ✤ සියලුම අයදුම්කරුවන් මනා චරිතයකින් හෙබි පුද්ගලයින් විය යුතුය.
- ✤ තෝරා ගනු ලබන බාහිර අයදුම්කරුවන් වසර 03 ක පරිවාස කාලයකට යටත්ව බඳවා ගනු ලබන අතර, තනතුරෙහි ස්ථිර කරන ලද අභ්‍යන්තර අයදුම්කරුවන් වසරක පරීක්ෂණ කාලයකට යටත්ව පත්කිරීම සිදුකරනු ලැබේ.
- ✤ සියලු තෝරා ගනු ලබන බාහිර අයදුම්කරුවන් අදාල වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් තලයේ පිහිටවනු ඇත.
- ✤ අභ්‍යන්තර අයදුම්කරුවන් අදාල තනතුරු සඳහා තෝරා ගතහොත් දැනට පවතින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන අනුව නියමිත වැටුප් පරිමාණයේ අදාල වැටුප් පියවර මත පවතිනු ඇත.

**අයදුම් කිරීම :-**

රජයේ දෙපාර්තමේන්තු රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශයද සහිතව තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

මෙම කාර්යාලයෙන් හෝ **http:/www.srilankateaboard.lk** වෙබ් අඩවියෙන් ලබාගත් නියමිත ආකෘති පත්‍රය පරිදි සකස් කරන ලද අයදුම්පත් උප්පැන්න සහතිකයේ සහ සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමඟ **2025 ජූලි 24** වන දිනට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලි.ප.තැ එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහල කෙලවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ශ්‍රී ලංකා තේ මණ්ඩලය**
**574, ගාලු පාර,**
**කොළඹ 3.**